**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2018**

**-----------------------------------------------------------------**

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එවකට ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව (ජාසජබැ) වර්තමානයේ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් පුනරුත්ථාපනය කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහල නැංවීම ඇතුළු මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් නිර්මාණය කිරීමෙන් වඩා හොඳ සනීපාරක්ෂක පහසුකම් මගින් මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|
| | | | --------------- |
| 2018 දෙසැම්බර් 31 දිනට ජාතික ජල ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.මිලියන 6,593.66ක් වූ ව්‍යාපෘතියේ කෙරී ගෙන යන වැඩ වටිනාකම එදිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 9,114.40 ක් වූ ව්‍යාපෘතියේ කල වැඩ වටිනාකම එකඟ නොවිනි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දූර්වලතාවය කි. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරන වාර්තා සමඟ වෙනස සැසඳීමට කටයුතු කළ යුතුය. | ශේෂයන් කාලීනව සැසඳීම් කළ යුතුය |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) අංක එස්.එල්.පී 99 දරන ණය ගිවිසුමේ උපලේඛණ 02 | ව්‍යාපෘතිය විසින් දරන ලද හෝටල් ගාස්තු, ආහාර වියදම් යනාදී එකතුව රු.මිලියන 3.70 කට සමාන ජපන් යෙන් මිලියන 2.58 ක් වූ දේශීය වියදම් අප ජල පිරිපහදු පිරියත, ප්‍රධාන පොම්පාගාර මධ්‍යස්ථානය,අපද්‍රව්‍ය පිරිපහදු අපහරණ පද්ධතිය, මඩිති වියළීමේ තටාංග සැලසුම් කිරීම හා ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව යටතේ ප්‍රතිපූර්ණය කර තිබුණි. | ව්‍යාපෘතිය සුදුසුකම් නොලබන වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. | අදහස් දක්වා නොමැත | මෙවැනි තත්ත්වයක් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2016 මාර්තු 24 දිනැති කලමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2016 | කලමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව විසින් අනුමත කරන ලද සේවක ලේඛණයේ නොමැති ව්‍යාපෘති සම්බන්ධීකරණය නිළධාරී තනතුර සඳහා ව්‍යාපෘතිය විසින් පුද්ගලයෙක් බඳවා ගැනීමට කටයුතු කර තිබුණි. ව්‍යාපෘති | නිශ්ඵල වියදමකි. | 2015 අප්‍රේල් 06 දිනැති මණ්ඩල තීරණයක් මඟින් ව්‍යාපෘති සම්බන්ධීකරණ නළධාරී පත් කරන ලදී. | වගකිව යුතු පාර්ශව හඳුනා ගත යුතුය. |

කටයුතු සඳහා සම්බන්ධ නොවූ මෙම නිළධාරියාගේ පැමිණීමේ වාර්තාද නඩත්තු කර නොතිබුණි. කෙසේ වුවද, 2016 අප්‍රේල් මස සිට වේතන ලෙස රු.මිලියන 1.79 ක් සහ පවරා තිබූ මෝටර් රථයේ ලීසිං ගාස්තු වෙනුවෙන් රු.මිලියන 2.53ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ කාර්යන්වල භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර එහි භෞතික ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| සංරචකය | කාර්යය | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත | සත්‍ය | | | |
| ජල හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | (අ) නිර්මාණ හා සැලසුම් කිරීම් | | | ව්‍යාපෘතියේ පිරිවැය ඉහළ යා හැක. | 2019 දෙසැම්බර් 31 දින දක්වා කාල දිගුවක් ලබා දී ඇත. | 2019 මැයි මස වන විට වැඩ නිම කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | - අපජල පිරිපහදු පිරියත | 100 | 75 | | | |
| | - ප්‍රධාන පොම්ප මධ්‍යස්ථාන | 100 | 53 | | | |
| | - මඩිති වියළිමේ තටාංග | තටාංග 05 | තටාංග 03 | | | |
| | (ආ) නිර්මාණ හා සැලසුම් කිරීම්<br>- ප්‍රධාන අපවහන ජාලය<br>(Trunk sewer net work) | කි.මී.6.23 | කි.මී.2.30 | ව්‍යාපෘති කාලය තුළ කාර්ය නිම කිරීම ප්‍රමාද විය හැක. | 2019 ජූලි 31 දින තෙක් කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. | එම |
| | කාණු සහිත (Open Cut) | කි.මී.2.87 | කි.මී.1.28 | | | |
| | කාණු රහිත (Trenchless) | | | | | |
| | - ශාඛා අපවහන ජාලය<br>(Branch sewer network) | කි.මී.71.1 | කි.මී.51.58 | | | |
| | කාණු සහිත | කි.මී.5.7 | කි.මී.0.69 | | | |
| | කාණු රහිත | | | | | |

| | | |
|---|---|---|
| - ප්‍රධාන නලය (Force main) | | |
| කාණු සහිත | කි.මී.3.18 | කි.මී.1.26 |
| කාණු රහිත | මීටර 173 | මීටර 17 |
| - ගෘහස්ථ අපවහන ජලය (Property Sewer net work) | | |
| | කි.මී.135 | කි.මී.93 |
| කාණු සහිත | කි.මී.11.24 | - |
| කාණු රහිත | | |
| - මනු බිල (Manhole) | 2,787 | 2,006 |
| - මනු බිල් පොම්ප මධ්‍යස්ථානය (Manhole pump station) | 9 | 5 |
| - වළවල් සේවා කිරීම (service pit) | 4,867 | 4,060 |
| - Intersect chambers | | |
| | 9,779 | 6,943 |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) අඩු ආදායම්ලාභීන් හට සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 21 දින වන විට නිම කර තිබූ අතර එහි දෝෂ වගකීම් කාලය 2019 මාර්තු 21 දිනෙන් අවසන් වේ. කෙසේ වුව ද ව්‍යාපෘතිය පෙන්වා දෙන ලද කාර්ය නිවැරදි කිරීමට 2019 අගෝස්තු 30 දින වන විටත් කොන්ත්‍රාත්කරු ක්‍රියා කර නොතිබුණි. | ඉදිකිරීම්වල ස්ථිර භාවයේ පවතින අවිනිශ්චිතතාව නිසා උනන්දුව දක්වන පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කර ගත නොහැක. | අදහස් දක්වා නොමැත. | පිළියම් කල යුතු කාර්ය නිම කිරීමට කොන්ත්‍රාත්කරු පෙළඹ විය යුතුය. |
| (ආ) ණය ගිවිසුම් අනුව අඩු ආදායම් ලාභීන්ට සනීපාරක්ෂක පහසුකම් සැපයීම වෙනුවෙන් රු.මිලියන 152ක් වෙන් කර තිබුණි. කෙසේ වුව ද, ව්‍යාපෘතිය විසින් එම අරමුණ සඳහා වැය කර තිබුණේ රු.මිලියන 60.76 ක් පමණි. | ව්‍යාපෘතිය අවසානයේ අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම්වලට අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කර ගත නොහැකි වේ. | පිරිවැය රු. මිලියන 101කට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවේ කාර්යයන් වර්ෂය අවසාන වන විටත් කෙරී ගෙන යමින් පැවතුණි. | කොන්ත්‍රාත්තුව යටතේ කාර්යයන් නිම කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) කොන්ත්‍රාත් ලේඛන අනුව ඇගයීමේ අරමුණ සඳහා වටිනාකම රු.මිලියන 30 හෝ ඊට වැඩි අන්තර් | ඇගයීම් සඳහා වැය වන කාලය හා පිරිවැය අනවශ්‍ය | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් 2018 අප්‍රේල් 6 | කොන්ත්‍රාත්කරුට අතිරේක මූල්‍ය ප්‍රති ලාභ ලැබීමේ |

| | | | |
|---|---|---|---|
| ගෙවීම් සහතිකපත් සලකා බැලිය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 30 ට අඩු අන්තර් ගෙවීම් සහතිකපත් ඇගයීම් කරන ලද අවස්ථා 04 ක් නිරීක්ෂණය විය. | පරිදි ඉහළ යයි. | දින ගන්නා ලද තීරණයක් අනුව මෙය ක්‍රියාත්මක කරන ලදි. | අවස්ථාවක් සැලසෙන බැවින් එම තත්ත්වය අවම කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) ව්‍යාපෘතිය විසින් බෝවල, දෙයියන්වෙල සහ ආලෝක රෝහල, මහනාම ප්‍රාථමික විද්‍යාලය අසල පරිශ්‍රයන්හි පොම්පාගාර ඉදිකිරීම් ආරම්භ කර තිබුණ ද අදාල ඉඩම්වල නිත්‍යානුකූල හිමිකම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් හිමිකරුවන් හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන අතර අරවුල් ඇති විය හැක. | ව්‍යාපෘති කටයුතු නිම කිරීමේ ප්‍රමාද වැළැක්වීම සඳහා ඉදිකිරීම් වැඩ ආරම්භ කරන ලදි. | නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**3.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණ | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| 2018 මැයි 18 දින පිරිවැය ජපන් යෙන් මිලියන 5.5 කට මිලට ගන්නා ලද මෝටර් රථය සඳහා දේශීය සහ ගුදම් ගාස්තු ලෙස රු.මිලියන 32.41 ක් වැය කර තිබුණි. කෙසේ වුව ද, මෝටර් රථය නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. | යෝග්‍ය නොවන අර මුදල් වෙන් කිරීමකි. | අදහස් දක්වා නොමැත. | මිලදී ගැනීම සඳහා ඉල්ලීම් කිරීමට ප්‍රථම ව්‍යාපෘතියේ සත්‍ය අවශ්‍යතාවයන් හඳුනා ගත යුතුය. |

**3.4 පද්ධති හා පාලන**

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අගය දැක්වීම | විගණකගේ නිර්දේෂ |
|---|---|---|---|
| (අ) 2016 ජුනි 10 දිනැති කලමනාකරණ විගණන චක්‍ර ලේඛ අංක 02/2016 පරිදි අභ්‍යන්තර විගණනකවරයෙක් බඳවා සේවයේ යෙදවීමට හෝ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන | අභ්‍යන්තර පාලනයේ දූර්වලතාවයකි | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණන කාර්යය සිදු කරයි. | අභ්‍යන්තර විගණන කටයුතු ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කරවීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය කටයුතු කර නොතිබුණි | | | |
| (ආ) මුදල් රෙගුලාසි 756 පරිදි සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් භෞතික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | වත්කම් කළමනාකරණයේ දුර්වල පාලනයකි. | භෞතික සමීක්ෂණයක් සිදු කළ යුතුය | ව්‍යාපෘතිය ස්ථාවර වත්කම්වල පැවැත්ම භෞතිකව තහවුරු කළ යුතුය. |